# ටීගෝ උප අලෙවි නියෝජිතයන්ට සම්මාන

ටීගෝ උප අලෙවි නියෝජිතයන් ඇගයීමේ උත්සවයක් පිලියන්දල, දම්පේ විලේජ් හෝටලයේදී පැවැත්විණි. මහරගම ප්‍රධාන ටීගෝ හවුල් කරුවකු වන සිස්කොම් සමාගම විසින් සංවිධානය කරන ලද මේ උත්සවයේ දී 2008 වර්ෂයේදී හොඳම ටීගෝ උප අලෙවි නියෝජිත සම්මානය පිලියන්දල රෝයල් ෆෝන් සමාගම විසින් හිමිකර ගන්නා ලදී. ඊට අමතරව කලාප වශයෙන් මහරගමින් වන්ටෙල් කොම්ද, හෝමාගමින් ගේට්වේ ආයතනය ද, පාදුක්කෙන් වායා කොමියුනිකේෂන් ආයතනය ද, කොට්ටාවෙන් ටොප් ලයින් ආයතනය ද සහ පිලියන්දලින් රෝයල් ෆෝන් ආයතනය ද සම්මාන හිමිකර ගන්නා ලදී.

2008 වර්ෂයේදී උප වෙළෙඳ නියෝජිතයින් වෙතින් කෙරුණු සේවාව ඇගැයීමකට ලක් කළ අතර ඔවුන්ට ඔවුන්ගේ සේවාවට ස්තුතිය පුද කිරීමක් ද මෙහිදී සිදු කෙරිණි.